# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 31 දරන රොනී ද මැල් - රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 ජුලි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජුලි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2000 අංක 31 දරන රොනී ද මැල් - රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 ජූලි මස 19 වන දින]

එල්. ඩී.- ඕ 77/98.

**රොනී ද මැල් - රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"රොනී ද මැල් - රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන භාරයක් එකී භාරයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා මෙතෙක් කල් ඇතිකර තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී භාරය ඇති කරන ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා එකී භාරයේ භාරකාර මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද ඒ භාරකාර මණ්ඩලය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2000 අංක 31 දරන රොනී ද මැල්-රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන රොනී ද මැල් රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මේ පනතේ උපලේඛනයේ ස්වකීය නම් දක්වා ඇති තැනැත්තන් හෝ භාරකාර මණ්ඩලයේ මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු "රොනී ද මැල් රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, භාරයේ භාරකාර මණ්ඩලය නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. රොනී ද මැල් රුහුණු විශ්ව විද්‍යාලයීය භාරයේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** භාරය ඇති කරන ලද්දේ යම් පොදු පරමාර්ථ උදෙසා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රීය ඉගැන්වීම් හා පර්යේෂණ සඳහා මහාචාර්ය ධුර සංස්ථාපනය කිරීම හා හිමි කොට දීම ;

(ආ) පර්යේෂණ හා ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුවට එය අදාළ කිරීම ;

(ඇ) රුහුණේ ඉතිහාසය, පුරා විද්‍යාව, සාහිත්‍යය, කලා සහ සංස්කෘතිය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අධීක්ෂණය සහ පාලනය යටතේ රුහුණු විශ්ව විද්‍යාලයේ සිසුන්හට නේවාසික හා සුබසාධන පහසුකම් සැලසීම ;

(ඉ) රුහුණු විශ්ව විද්‍යාලයේ පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම ;

(ඊ) රුහුණු විශ්ව විද්‍යාලයේ ක්‍රීඩා සහ විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් ක්‍රීඩාපිටි සහ පහසුකම් සැපයීම ;

(උ) රුහුණු විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ට ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි දී උපාධි මෙන්ම පශ්චාත් උපාධි අධ්‍යයනය කටයුතු සඳහා මුදල්මය ආධාර, ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ; සහ

(ඌ) සංස්ථාවේ අදහස අනුව රුහුණු විශ්ව විද්‍යාලයේ අභිවර්ධනයට ඉවහල් වන වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

භාරයේ නිර්මාතෘ යාවජීව සභාපති විය යුතු බව.

**4.** භාරයේ නිර්මාතෘ, එකී ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් මිස, සංස්ථාවේ යාවජීව සභාපති වියයුතු අතර, ඔහුගෙන් පසු සංස්ථාවේ සභාපති වශයෙන් ඔහුගේ අනුප්‍රාප්තිකයා ඔහු විසින් නම් කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**5.** (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට හා භාරයේ නියමවලට යටත්ව, භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික හෝ සියලු ක්‍රියා සහ දේ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

(2) (1) වන උප වගන්තියෙන් පවරා දී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල සංස්ථාවට ඇත්තේ ය :-

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ රික්ථවරණය කිරීමක් මගින් හෝ අන්‍ය කවරාකාරයකින් වුවද සංස්ථාව වෙත සතු වන යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම සහ දැරීම ;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදුදීම, පවරා දීම, රික්ථවරණය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීම ;

(ඇ) භාරයට අයත් අරමුදල් සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි භාණ්ඩාගාර බැඳුම්කරවල, භාණ්ඩාගාර බිල්පත්වල හා වෙනත් යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම සහ ඇප ඇතිව හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඉ) භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම;

(ඊ) මුදල් එකතු කිරීම සහ මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ප්‍රදාන හෝ ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම; සහ

(උ) භාරයේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

6. (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ භාරයේ නියමයන්ට අනනුකූල නොවන රීති, පහත සඳහන් කාරණා සියල්ලම සංස්ථාවේ රීති.

සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය :-

(අ) රුහුණු විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරිම සහ මුදල් ආධාර දීම ;

(ආ) සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය;

(ඇ) සංස්ථාවේ සාමාජිකයන්ගේ සහ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීම ;

(ඉ) භාරයේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වා ගෙන යාම හා විගණනය කිරීම ; සහ

(ඊ) භාරයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී වෙනස් කිරීම, එය සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත් කාලයේ සංස්ථාවේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. සංස්ථාවේ අරමුදල-

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ බැරට තිබුණු සියලු මුදල් වලින් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු සංස්ථාවට එකතු වන සියලු මුදල්වලින්

සමන්විත විය යුතු ය.

8. (1) සංස්ථාවේ සියලු ආදායම් හා වියදම් පිළිබඳ නිසි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සංස්ථාව විසින් පත් කරනු ලබන විගණකවරයන් විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

ගිණුම් විගණනය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි භාරයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් පිහිටුවනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය සහ දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

භාරය විසින් ගෙවිය යුතු සහ භාරයට ලැබිය යුතු ණය.

10. සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාව භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ අනුමැතිය ඇතිව සහ සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු, ඉදිරිපිට දී මිස එය කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තවද තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාමාජිකයන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන් ගේ හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**උපලේඛනය** **(2 වන වගන්තිය)**

භාරකාර මණ්ඩලය :

රොනල්ඩ් ජෝසප් ගොඩ්ප්‍රි ද මැල් මහතා (සභාපති) (නිර්මාතෘ)
ආචාර්ය වර්ණසේන රාසපුත්‍රම් මහතා
මහාචාර්ය අයාල් ජයතිලක මහතා
ජනාධිපති නීතිඥ රංජිත් අබේසූරිය මහතා
ඒලියන් නානායක්කාර මහතා
මල්ලිකා ද මැල් මහත්මිය
රුහුණු විශ්ව විද්‍යාලයේ උපකුලපති (නිල බලයෙන්)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.